# මධ්‍යම පළාත් සභාව
மத்திய மாகாண சபை
CENTRAL PROVINCIAL COUNCIL

## මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන

## மத்திய மாகாண பிரதான மற்றும் கல்வி

## Central Provincial Chief And Education

Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

மாகாண சபைக் கட்டிடத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale

විද්‍යුත් තැපැල් மின் அஞ்சல் E-mail pemcentral@gmail.com | වෙබ් අඩවිය இணையம் Website www.cpm.lk

| | | | | |
|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය அமைச்சு அலுவலகம் Ministry Office } 081-4481322 | ලේකම් செயலாளர் Secretary } 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් சிரேஷ்ட உதவி செயலாளர் Senior Assistant Secretary } 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී பிரதான கணக்காளர் Chief Accountant } 081-2424935 | ෆැක්ස් தொலைநகல் Fax } 0812424058 |


මගේ අංකය எனது இல. My No } සිපිසි/සිඑම්එස්/1/29/1/13-2

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதි Date } 2025.01. 03

මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්,
මධ්‍යම පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

## මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු දෙකෙන් එක් තනතුරක් 2024.12.04 දින සිට පුරප්පාඩු වී ඇත. පුරප්පාඩුවී ඇති අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා දිවයිනේ සියලුම පළාත්වල අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ පවතින ආයතනයන්හි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සමග අමුණා ඇති නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනයන්හි සහ ජාතික පාසල් ඇතුළු සියලුම පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ද දැනුවත් කර, ඔවුන්ගේ අයදුම්පත් 2025.01.20 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මයුෂානි පියසේන
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

පිටපත්-

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.
3. ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.
4. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත - කා.දැ.ගැ.ස.

**නිවේදනයයි**

**මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත්**

**අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:-**

01. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුයි.
02. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සඳහන I වන හෝ II වන උපලේඛනය යටතේ සිදුකරන ලද පූර්වාසන්න වසර 5ක වරදකට දඬුවම් නොලැබූ අයෙකු හෝ කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හෝ එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු හෝ නොවිය යුතුයි.
03. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ නියමිත පරිදි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.
04. අයදුම්පත් කැඳවන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**සටහන :-**

සුදුසුකම් සනාථ කෙරෙන සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකවල සහතික කල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමය :-**

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීම මගින් (අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය ඇමුණුම 02 ලෙස ඇතුළත් කර ඇත).

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

අයදුම්පත් **www.cmcp.gov.lk** යන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැක. සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2025.01.20 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව සකස් කර **"ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම."** යනුවෙන් සඳහන් කළ යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය භාරගනු නොලැබේ.

මධුපානි පියසේන
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.